සත්කාරය

ධන ධාන්‍ය නිධානයකට මග පෙන්වූ පාරිසරික කෘෂිකාර්මික

ධන ධාන්‍ය සම්පිරි දැයට

බුලත්

DEPARTMENT OF EXPORT AGRICULTURE
DEA

- වගා කිරීම
- වගා නඩත්තුව
- අස්වනු සැකසීම

- වගාවට පෙර ගල් වැටි, කාණු හා පීවි වැටි යන පාංශු හා ජල සංරක්ෂණ උපක්‍රම යොදා ඔබේ ඉඩම සංවර්ධනය කරන්න.
- වැඩි ආදායමක් සඳහා යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් යොදා පරිසර හිතකාමීව වගාව මනාව නඩත්තු කරන්න.

BETEL

Piper betle (L)

වැඩි විස්තර දැනගන්න විමසන්න

අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරි
සෑම බදාදා දිනකම ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී

සහකාර අධ්‍යක්ෂ
අපනයන කෘෂිකර්ම දිස්ත්‍රික් කාර්යාල වල දී

අපනයන කෘෂිකර්ම තොරතුරු කේන්ද්‍රය-ගැටඹේ
දුරකතන අංක 0812-388651

dea.information2017@gmail.com

www.exagri.info

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, පේරාදෙණිය. දුරකතන 081-2388651

සැකසුම : මාධ්‍ය හා සන්නිවේදන අංශය

හැඳින්වීම

ශ්‍රී ලාංකේය සංස්කෘතියේ බොහෝ අංගවල ප්‍රධානතම සංඛේතය බුලත් වේ. එහි සම්භවය ගිණිකොණ දිග ආසියාවේ මැලේසියාව ආශ්‍රිතව සිදුවී ඇති බවට විශ්වාස කෙරේ. වර්තමානයේ ශ්‍රී ලංකාව, ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය හා අප්‍රිකාව වැනි රටවල සුලභව බුලත් වගා කෙරේ. ඒ අතරින් ශ්‍රී ලංකාවේ පවතින පස හා දේශගුණය තුළ උසස් ගුණාත්මයෙන් යුත් බුලත් නිපදවේ. වර්තමානයේ දිවයිනේ බුලත් වගා වපසරිය අක්කර 12,000ක් පමණ වේ. මේ සඳහා කුරුණෑගල, ගම්පහ, කොළඹ, කළුතර හා වියළි කලාපයේ ඇතැම් ප්‍රදේශ දායක වේ. බුලත් වගා කිරීමේ හා බුලත් සැපීමේ පුරුද්ද ක්‍රි.පූ.340 පමණ ඈතට දිවයයි. මෙම ඓතිහාසික කර්මාන්තය වර්තමාන විදෙස් වෙළඳ පොළ ද ජයගෙන ඇත. ඒ අනුව එහි ප්‍රධාන ගැනුම්කරුවා පාකිස්ථානය වේ. මීට අමතරව ප්‍රංශය, ජර්මනිය, ලෙබනනය, මාලදිවයින හා මැලේසියාව ආදී රටවල් සැලකිය යුතු බුලත් ප්‍රමාණයක් මිලදී ගනී. බුලත් බෝගය තනි වගාවක්, පොල් වැනි ඉඩම්වල අතුරු වගාවක් ලෙස හෝ ගෙවතු ආශ්‍රිතව ද සාර්ථකව වගා කෙරේ.

අපනයන තත්ත්වයේ බුලත්වල තිබිය යුතු ගුණාංග

- හොඳින් මේරූ නද කොළ පැහැ පත්‍ර වීම.
- කඩතොලු වලින් තොරවීම.
- බුලත් කොළයක් සෙ.මි. 20ක් දිග හා සෙ.මී. 15 ක් පමණ පළල වීම.
- සැපයීමේදී සැර ගතියක් තිබීම.

වගාවට අවශ්‍ය පාරිසරික තත්ව

මුහුදු මට්ටමේ සිට උස මීටර් 1,000 දක්වා ප්‍රදේශ, වර්ෂය පුරාම පැතිරුණු වර්ෂාපතනයක් හා දීප්තිමත් හිරු එළිය පැවතීම. අපනයනය සඳහා බුලත් වැවීමට තෙත් හා අතරමැදි කලාප වඩාත් සුදුසුය.

සුදුසු බිමක් තේරීම

- සමතලා බිමක් වීම.
- ප්‍රශස්ථ හිරු එළිය.
- මනා ජලවහනය සහිත බොරළු පසක් තිබීම.
- ජල ප්‍රභවයක් තිබීම.

රෝපණ ද්‍රව්‍ය ලෙස බුලත් දඬු තේරීම

වැඩි අස්වැන්න සහිත නිරෝගී වැලක් වීම.
දේශීය වෙළෙඳපොළ අවශ්‍යතා සඳහා නම්, ගැට අතර පරතරය අඩු, ලා කොළ පාට කුඩා බුලත් කොළ සහිත වැලකින් ද, අපනයන වෙළෙඳපොළ සඳහා නම්, ගැට අතර පරතරය වැඩි, තද කොළ පාට විශාල පත්‍ර ඇති වැලකින් ද, බුලත් දඬු තෝරාගත යුතුය.

පාත්ති සැකසීම

අඩි 4 ක් පළල, අඩි 25 කට නොවැඩි කැමති දිගකට පාත්තියක් සකසාගත හැක.

පාත්තියේ බිම අඩි 1.5ක් පමන ගැඹුරට පස පෙරලා ඉතා සියුම් වන ලෙසට කැට පොඩි කර සකසාගත යුතුය. පාත්තිය පොළව මට්ටමෙන් සෙ.මී.10ක් පමන ගැඹුරට සිටින සේ ගිළුණු පාත්තියක් ලෙස සකසා ගත යුතුය.

බුලත් වගාවක් සඳහා ඉතා සීඝ්‍රයෙන් රෝග බෝවන නිසා වගාවේ දී සනිපාරක්ෂක පිළිවෙත් ඉතාම සියුම් ලෙස පිළිපැදීම වැදගත් වේ. මේ හේතුවෙන් නිරෝගී බුලත් වගාවක් සඳහා දඬු ක්ෂේත්‍රයේ සිටුවීමට පෙර පාත්ති ජීවාණුහරණය කිරීම වැදගත්ය.

පාත්ති ජීවාණුහරණය කිරීම

පස තැම්බීමක් මගින් සිදුකරන ජීවාණුහරණයක් බැවින් මුලින්ම සකසන ලද පාත්තිය තෙමෙන සේ ජලය යෙදීම කළ යුතුය.

ඉන්පසු ඒ මත ඝණකම අඟල් 4-6 ක් පමණ වන සේ පිළිවෙලට පිදුරු, දහයියා හා පිදුරු ලෙස තට්ටු තුනක් අතුරා සුළං හමන දෙසට විරුද්ධ දිශාවට ගිනි ගන්නා ලෙසට ගිනි තැබිය යුතුය.

ජීවාණුහරණය කළ පාත්තියක් දින 07ක් පමණ තැබීමෙන් පසුව බුලත් දඬු සිටුවා ගැනීමට සුදුසුය.

මනා ජල වහනයක් ඇති කිරීමට හා පිටතින් ගලා එන ජලය පාත්තිය හරහා ගලා නොයෑම සඳහා පාත්තිය වටා අඩියක් පමණ පළල අඩි ½ ක් පමණ ගැඹුර කාණුවක් යොදාගත යුතුය.

කාබනික පොහොර යෙදීම

බුලත් වගාවට රසායනික පොහොර වලට අමතරව කොම්පෝස්ට්, කොළ පොහොර හෝ කාබනික පොහොර යෙදීම යෝග්‍ය වේ. එසේම ගොම පොහොර, එළු පොහොර හෝ කුකුල් පොහොර වැනි සත්ව පොහොර ද භාවිතා කළ හැකිය.

බුලත් දඬු සිටුවීම

පාත්තියේ අඩි 1.5x1.5 පරතර වලින් දඬු සිටුවන තැන් ලකුණු කර, එක ඉන්නකට බුලත් දඬු දෙකක් වන සේ සිටුවා ගැනීම කළ යුතුය. එක් දණ්ඩක් පුරුක් දෙකකින් සමන්විත වන සේ සකසා එක් පුරුකක් පසට යට වන සේ සිටුවා ගත යුතුය. දඬු සිටුවීමෙන් පසු පාත්තිය පොල් අතු යොදා ආවරණය කර ගත යුතු අතර දිනපතා ජලය සැපයීම කළ යුතුය.

බුලත් වගාවේ ආධාරක සිටුවීම

රළු මතුපිටක් සහිත අඟල් 1 ක විශ්කම්භයක් සහිත අඩි 8ක් පමණ උස ලී ඉණි භාවිතා කිරීම සුදුසුය. මහෝගනී, තේක්ක වැනි ශාකවල හරස් අතු හෝ අඟල් 2x2 ප්‍රමාණයේ පලාගත් ලී ද මේ සඳහා සුදුසුය. බුලත් වැල් ඉහළට වැඩීමත් සමඟ ම ඒවා ඉන්නට තබා ගැට ගැසීම නිරන්තරයෙන්ම කළ යුතුය.

පොහොර යෙදීම

ඉණි සිටුවීමත් සමගම පළමු පොහොර මිශ්‍රණය ලෙස සෙ.මී.10ක ඝණකමට හොඳින් දිරූ ගොම පොහොර තට්ටුවක් පාත්තිය පුරා අතුරා පාත්තියේ අඩියක් පමණ ගැඹුරට හොඳින් මිශ්‍ර වන සේ කලවම් කරන්න.
ඉන්පසුව අපනයනය සඳහා බුලත් නිෂ්පාදනය කරනුයේ නම් සති 3කට වරක් ද දේශීය වෙළෙඳපොළ වෙත නිපදවන්නේ නම් මාස 1½ කට වරක් ද පොහොර යෙදීම නිර්දේශ කරනු ලැබේ.

ඉණි 100ක පාත්තියක් සඳහා රසායනික පොහොර මිශ්‍රණය

යූරියා	ග්‍රෑම්	195
ත්‍රිත්ව සුපර් ෆොස්ෆේට්	ග්‍රෑම්	65
මියුරේට් ඔෆ් පොටෑෂ්	ග්‍රෑම්	100
කිසරයිට්	ග්‍රෑම්	60
මුළු ප්‍රමාණය	ග්‍රෑම්	420

මෙම නිර්දේශිත පොහොර ප්‍රමාණය සුළු ප්‍රමාණයක් බැවින් ඒකාකාරව පාත්තිය පුරා මිශ්‍ර කිරීම සඳහා වැලි හෝ ගොම පොහොර කුඩු සමඟ හොඳින් මිශ්‍ර කර යෙදීම සුදුසු වේ. පොහොර යෙදූ පසු පාත්තිය හොඳින් ජල සම්පාදනය කර වසුන් යෙදීම කළ යුතුය.

අස්වනු නෙලීම

බුලත් වගාවේ අස්වනු නෙලීම බුලත් වැල මීටර් 1.8ක් පමණ දික් වූ පසු එනම් වැල පන්දලමට යාන් වූ පසු සිදු කරයි. ප්‍රධාන කදේ මේරූ කොළ සියල්ලම ඉවත් කිරීම හා ශාඛා වල (පළුකන් වල) ඇති ප්‍රථම මේරූ කොළ ද ඉවත් කළ යුතුය. එතැන් සිට සති දෙකකට වතාවක් දේශීය වෙළෙඳපොළ සඳහා ද සති තුනකට වතාවක් විදේශීය වෙළෙඳපොළ සඳහා ද මේරූ කොළ අස්වැන්න ලෙස නෙලීම සිදු කළ හැක.

දෙවන වසරට පසුව ඉනි 100ක වගාවකත් එක් අස්වනු වාරයකට බුලත් කොළ 6,000-8,000 ක් නෙලාගත හැකිය. සාර්ථක වගාවක් විසර 06 ක් පමණ අස්වනු ලබාදේ.

ප්‍රධාන රෝග - බැක්ටීරියා කොළ පුල්ලි රෝගය

බැක්ටීරියා කොළ පුල්ලි රෝගය බුලත් වගාවට වැළඳිය හැකි දරුණු රෝගයක් වන අතර ආසාදිත බුලත් වැල් දුටු විගාම එම ස්ථානයේම පිලිස්සීම වඩාත් සුදුසුම මර්දන ක්‍රමය වේ.

රෝග ලක්ෂණ

පත්‍ර මත තෙල් පැල්ලම් වැනි පුල්ලි හට ගනී. ක්‍රමයෙන් මෙම ලප විශාල වී එකිනෙකට යා වේ. අවසානයේ පත්‍ර හා නටු වෙන්වී හැලී යයි. (වැල් වලට ජලය සැපයීමේදී පොදු ජල මාර්ග වලින් ජලය යෙදීමෙන් වලකින්න.)

විශේෂ උපදෙස්

- සුළඟින් බෝවන රෝග පාලනය කිරීමට වගාව සුළඟින් ආවරණය කරන්න. (පොල් අතු මඟින්)
- අධික සෙවන, වගා බිමෙන් ඉවත් කරන්න.
- රෝග පළිබෝධ නිසා අත්හල පැරණි ඉඩම්වල වගාව සිදු නොකරන්න.
- ඉඩමේ බෝග මාරුව විටින් විට සිදුකරන්න.
- ඉවතලන හා කුඩා බුලත් කොළවලින් අතුරු නිෂ්පාදන කළ හැකිය. (ඖෂධ, හඳුන්කූරු, මඳුරු දැගර ආදිය)

වැඩි විස්තර හා පුහුණු අවශ්‍යතා සඳහා :-

අතුරු බෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය, දම්පැලැස්ස, නාරම්මල

037-2249337 / 037-2248879

අටු කොටු පිරී රටක් - අතවිට සරු හෙටක් සඳහා අපනයන කෘෂි බෝග වවමු.